ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය 2006

සාධාරණත්වයේ මූලධර්ම - LWU 1202

කාලය - පැය තුනයි.

---

දිනය - 2006.03.23 වේලාව - ප.ව.01.30 -පව.04.30 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

*පළමු කොටසින් එක් ප්‍රශ්නයකට ද දෙවන කොටසින් ප්‍රශ්න හතරකට ද වනසේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.*

## 1 වන කොටස

01. සාධාරණත්වයේ එක් දායකත්වයක් වන්නේ, අභිමතානුසාරී සාධාරණත්ව ප්‍රතිකර්මයන්හි පුළුල් පරාසයක් හඳුන්වා දීම තුළින් නෛතික ප්‍රතිකර්මයන්හි සීමාසහිත බවට ඌණ පූර්ණයක් සැපයීමයි.

**Phillip Pettit** ***Equity and the law of Trusts*** **8th Edition p.38**

පැහැදිලි කරන්න.

02. "සාධාරණත්වයේ වර්ධනය උදෙසා සාධාරණත්වයේ ආප්තයන් විශාල පිටුවහලක් වී ඇත."

පැහැදිලි කරන්න.

## 2 වන කොටස

03. (අ) භාර ආඥා පනතේ දෙවන වගන්තිය පැහැදිලි කරන්න.

(ආ) භාර ආඥා පනතේ දෙවන වගන්තිය අවලංගු කළ යුතුයැයි කමිටුවක් මඟින් නිර්දේශ කර ඇත.

ඔබ මෙම නිර්දේශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

04. (i) වලංගු ප්‍රකාශිත භාරයක් ඇති කිරීම සඳහා සම්පූර්ණ කළයුතු ආවශ්‍යතාවයක් භාර ආඥා පනතේ ප්‍රතිපාදන ඇසුරින් පැහැදිලි කරන්න.

(ii) ප්‍රනාන්දුගේ අන්තිම කැමති පත්‍රය මගින් කරන ලද පහත සඳහන් ප්‍රදානයන් මගින් වලංගු භාරයක් නිර්මාණය වේදැයි සාකච්ඡා කරන්න.

(අ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීති අංශයට ඇතුළත්වන තම මුණුපුරු මිණිපිරියන් අතර බෙදා දීම සඳහා රු.100,000/- ක් රෝහිණීට

(ආ) රු.200,000/- ක මුදලක් මාගේ සොහොන්කොත නඩත්තු කටයුතුවලට භාවිතා කිරීම සඳහා ලංකාට

05. (අ) ජිනීවාහි ජාත්‍යන්තර සංවිධානයක සේවය කල කාලයේදී ලාල් විසින් තම සොහොයුරු අරුන්ගේ නමින් ශ්‍රී ලංකාවේ ඉඩම් කට්ටියක් මිළදී ගන්නා ලදී. විශ්‍රාම යාමෙන් අනතුරුව ලාල් ශ්‍රී ලංකාවට පැමිණි අතර, ඉඩම තමාට පවරා දෙනමෙන් අරුන්ගෙන් ඉල්ලා සිටියේ ය. නමුත් අරුන් එය ප්‍රතික්ෂේප කළේය.

ලාල්ට උපදෙස් දෙන්න.

(ආ) යශෝ තම උසස් අධ්‍යාපන කටයුතු සඳහා ලන්ඩනයට යාමට තීරණය කළ බැවින්, ඇගේ මිතුරියක වන ප්‍රියාට කිසිදු ප්‍රතිෂ්ඨාවකින් තොරව, තම තේ වත්ත පවරන ලදී. යශෝ නැවත ලංකාවට පැමිණි පසු තේ වත්ත නැවත පවරා දෙන ලෙස ප්‍රියාගෙන් ඉල්ලා සිටියාය. ප්‍රියා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළාය.

යශෝට උපදෙස් දෙන්න.

06. බන්දුලගේ අන්තිම කැමති පත්‍රයේ සඳහන් පහත සඳහන් ප්‍රදානයන් වලංගු පුන්‍යභාර ඇති කරන්නේ දැයි සාකච්ඡා කරන්න.

(අ) රු.900,000/- ක මුදලක්, සුනාමියෙන් විපතට පත් සිසුන්ට ශිෂ්‍යයන්ට ලබාදීම සඳහා විවෘත විශ්වවිද්‍යාලයට.

(ආ) රු.300,000/- ක මුදලක්, දඩාවතේ යන සුනඛයන් සඳහා වඳ සැත්කම් කිරීමට. සුනඛ මිතුරු සමාජයට (Dog Lover's Association)

(ඇ) රු.100,000/- ක මුදලක්, ක්‍රිකට් තරඟාවලියක් සංවිධානය කිරීම සඳහා හැටන් යෞවන සමාජයට

(ඈ) රු.500,000/- ක මුදලක්, පරිසර ආරක්ෂාව දිරිගැන්වීම සඳහා විවෘත විශ්වවිද්‍යාලයේ පරිසර සමාජයට

07. වශීෂ් භාරයක් ඇති කරයි. ගාමිණී සහ සමන් එහි භාර කරුවන් විය. භාර දේපල වූයේ පොල්වත්ත නැමැති ඉඩමකි. භාර ලේඛණය මගින් වශීෂ්ගේ දරුවන් වන භාමා සහ වාමා රැකබලා ගැනීම සඳහා පොල් ඉඩමේ ආදායම යෙදවිය යුතු බවට සඳහන් විය. තවදුරටත් එහි සඳහන් වූයේ දරුවන් වයෝප්‍රාප්තත්වයට පැමිණි පසු භාරකරුවන් විසින් ඉඩම දරුවන්ට පැවරිය යුතු බවයි. ගාමිණී සහ සමන් ආදායමෙන් අඩක් ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා යොදා ගත්හ. පසුව ගාමිණී ඉඩමෙන් අඩක් තම දියණිය වන රම්‍යාට පවරා පදිංචියට ඕස්ට්‍රේලියාවට ගියේ ය.

තම අයිතිවාසිකම් සම්බන්ධයෙන් භාමාට සහ වාමාට උපදෙස් දෙන්න.

08. පහත සඳහන් ඕනෑම දෙකක් සම්බන්ධයෙන් සටහන් ලියන්න.

(අ) වර්ධනය කිරීමේ පූර්ව නිගමනය **(Presumption of Advancement)**

(ආ) භාර ආඥා පනතේ 90 වගන්තිය

(ඇ) **Cey - pres** සිද්ධාන්තය

- හිමිකම් ඇවිරිණි. -

LIBRARY